සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

Learning Resource Centre
De Mazenod College
Kandana
58163

වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
Year End Evaluation - 2024 (2025)

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ශ්‍රේණිය தரம் Grade | 10 | විෂයය பாடம் Subject | ඉතිහාසය | පත්‍රය வினாத்தாள் Paper | I | කාලය காலம் Time | පැය 1 යි |

නම பெயர் Name ..................................... විභාග අංකය சுட்டிலக்கம் Index No. ...........................

සැලකිය යුතුයි.

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 80 ක් හිමි වේ.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති 1,2,3,4 යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු ලකුණු කිරීමේ පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

01. ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමේ දී වැදගත් වන ග්‍රීක මූලාශ්‍රයක් වන්නේ මින් කුමක් ද?
    1. නැචුරලිස් හිස්ටෝරියා
    2. ඉන්ඩිකා
    3. එදා හෙළදිව
    4. භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය

02. මෙරට පැරණිතම ශිලා ලේඛන සම්බන්ධ නිවැරදි ප්‍රකාශ පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
    A බ්‍රාහ්මීය ලිපි ලෙස හඳුන්වා තිබීම.
    B විහාරාරාම වලට ගම්බිම් පිදීම වැනි කරුණු වාර්තා කර තිබීම.
    C භික්ෂූන්ට ලෙන් පිදීම වැනි කරුණු වාර්තා කර තිබීම.
    D බදු අය කිරීම වාර්තා කිරීම.
    1. A හා C
    2. B හා C
    3. A හා D
    4. B හා D

03. මෙරට ප්‍රාග් ඓතිහාසික යුගයේ මිනී වැළලීම් සම්බන්ධයෙන් ඇටසැකිලි නවා වකුටු කර වළලා තිබීම පිළිබඳ සාක්ෂි හමු වී ඇත්තේ කුමන ස්ථානයක ද?
    1. රාවණාඇල්ල ලෙන
    2. කිතුල්ගල බෙලිලෙන
    3. බටදොඹ ලෙන
    4. අත්තනගොඩ අළුලෙන

04. සමස්ත දකුණු ආසියාවට ම බලපාන ලද දේශගුණ විපර්යාසයන් පිළිබඳ දේශගුණ විද්‍යාඥයින් කරුණු අනාවරණය කර ඇති ක්‍රි. පූ. 7000 - 4500 අතර මැත භූ අවධිය වන්නේ මින් කුමක් ද?
    1. ප්ලයිස්ටොසීන යුගය
    2. මධ්‍යකාලීන යුගය
    3. හොලෝසීන යුගය
    4. ප්‍රාග් ඓතිහාසික යුගය

05. පළමුවන විජයබාහු රජතුමාට අයත් පනාකඩුව තඹ සන්නසේ 'තුරුපුර' යනුවෙන් සඳහන් කොට ඇති නගරය කුමක් ද?
    1. තිස්සමහාරාමය
    2. මාගම
    3. හම්බන්තොට
    4. අනුරාධපුරය

06. අතීත ශ්‍රී ලංකාවේ වැව් පද්ධතීන් හා ඊට අයත් ගම් කිහිපයක ජීවත් වූ වැසියන්ගේ සුභ සිද්ධිය වෙනුවෙන් තීරණ ගැනීමේ බලයක් පැවරී තිබුණේ කාට ද?
    1. ගෘහපති
    2. ගමික
    3. මපුරුමුකා
    4. පරුමක

07. පහත සඳහන් සිදුවීම් සිදු වූ අනුපිළිවෙල අනුව පෙළ ගැසූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

A දේවානම්පියතිස්ස රජතුමා ශ්‍රී මහා බෝධිය රෝපණයට ප්‍රාදේශීය නායකයින්ට ආරාධනා කිරීම
B භාතිකාභය රජතුමා වීදුරු පබළු රැගෙන ඒමට රෝමානු දේශයට තානාපති නිලධාරීන් යැවීම
C මහා විජයබාහු රජතුමා තිලෝකසුන්දරී කුමරිය විවාහ කරගැනීම
D පණ්ඩුකාභය රජතුමා අනුරාධපුරය පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගැනීම

1. ACBD 2. DABC 3. BDAC 4. DBAC

08. අතීත ශ්‍රී ලංකාවේ රජුට සහය වූ නිලධාරීන් හා ඔවුන්ට පැවරුණු කාර්යයන් නිවැරදිව ගලපා පිළිතුර තෝරන්න

| | | | |
|---|---|---|---|
| 1 | නගර ගුත්තික | A | නාගරික වාස්තු විද්‍යාඥයා |
| 2 | නගර වඩ්ඪකී | B | රාජ්‍ය ලේඛනාගාර ප්‍රධානී |
| 3 | පත අදෙක | C | නගර පරිපාලක |
| 4 | කන පෙඩික | D | වෙළෙඳ කටයුතු භාර ප්‍රධානී |

1. CADB 2. ACDB 3. BCDA 4. DBAC

09. තමාව හඳුන්වා දීමට තම සෙල්ලිපි වල "කාලිංග චක්‍රවර්ති ස්වාමීන් වහන්සේ" යන පදය භාවිත කළ පාලකයා වන්නේ කවුරුන් ද?

1. මහසෙන් රජතුමා
2. නිශ්ශංකමල්ල රජතුමා
3. පළමුවන කාශ්‍යප රජතුමා
4. ධාතුසේන රජතුමා

10. A අභ්‍යන්තර පාලනය විධිමත් කිරීම
B චෝල පරාජය කොට රට එක්සේසත් කිරීම
C මහ වැව් තැනීමේ ආරම්භකයා වීම
D බදු අය කිරීම ක්‍රමවත් කිරීම

ඉහත දැක්වෙන තොරතුරු අතරින් වසභ රජතුමාගේ කාර්යයන් පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. BCD 2. ABC 3. ACD 4. ABD

11. භාෂා ආගම් අතින් වෙනස් වුවද තමන්ගේ අසල්වැසි රටවල ප්‍රජාව දෙස විශ්වාසවන්ත ලෙස කටයුතු කිරීම අපේ පැරණි පාලකයන්ගේ විදේශ ප්‍රතිපත්තිවල කැපී පෙනෙන ලක්ෂණයකි. මෙයට නිදසුනක් වන්නේ,

1. හයවෙනි අග්ගබෝධි රජතුමා චීනය සමඟ වෙළෙඳ සබඳතා පැවැත්වීම යි.
2. පළමුවන ගජබාහු රජතුමා පත්තිනි දේවාලයක් විවෘත කිරීමට දකුණු ඉන්දියාවට යාම යි.
3. ශ්‍රී ලාංකීය රජවරු ඉස්ලාමීය රජවරු සමඟ තෑගි හුවමාරු කර ගැනීම යි.
4. දළදා මාළිගාවේ ආරක්ෂාවට වේලෙක්කාර හමුදාව යොදා ගැනීම යි.

12. පැරණි කාලයේ මෙරට පැවැති හේන් වගාව බුත්සරණ නම් කෘතියේ හඳුන්වා ඇත්තේ කුමන නමකින්ද?

1. සෙහෙන් 2. හේන් 3. පිටිබිම් 4. නව දැලි හේන

13. ක්‍රි. ව. 850 දී මෙරටට පැමිණි අරාබි දේශ ගවේෂකයා කවුරුන් ද?

1. අල්බලසූරි 2. සුලෙයිමාන් 3. ඉබන් බතූතා 4. කොස්මොස්

14. අතීතයේ වෙළෙඳාම සඳහා මෙරටට පැමිණි විවිධ ජාතීන් හා ඔවුන් පැමිණි ප්‍රදේශ නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර කුමක් ද?

| | | | |
|---|---|---|---|
| 1 | අයෝනියන්වරු | A | මලය අර්ධද්වීපය |
| 2 | කාම්බෝජවරු | B | දකුණු ඉන්දියාව |
| 3 | ජාවකවරු | C | ඇෆ්ගනිස්ථානය |
| 4 | දෙමළ වෙළෙන්දෝ | D | මැසිඩෝනියාව |

1. BCDA 2. ACDB 3. DCAB 4. CDAB

15. "යමෙක් රූපයෙන් යෞවන ගුණයෙන් සහ ඥානයෙන් යුක්ත වුවත් ඔහු හෝ ඇය යම් ශිල්ප ශාස්ත්‍රයක් නොදන්නේ නම් සුවඳ නොමැති කැලෑ මලකට සමාන බව" කියැවෙන මූලාශ්‍රය පහත පිළිතුරු අතරින් තෝරන්න.

1. ලෝකෝපකාරය 2. සමන්තපාසාදිකාව 3. සියබස්ලකර 4. සසදාවත

16. මීට අවුරුදු තුන්දහස් දෙසිය පනහකට පෙර මෙරට වැසියන් දහනය සඳහා ඔක්සිජන් වායුව අවශ්‍ය බව දැන සිටීම පිළිබඳ සාක්ෂි හමුවන ස්ථානයක් වන්නේ මින් කුමක් ද?

1. යටිගල්පොත්ත
2. ඉබ්බන්කටුව
3. ගල්සොහොන් කනත්ත
4. රංචාමඩම

17. අතීතයේ වියලි කලාපයේ වැසියන් තම පෞද්ගලික ජල පරිහරණය සඳහා ළඟරා කැට ළිං ඉදිකිරීමේ අරමුණ වී ඇත්තේ,

1. වියලි කලාපයේ වර්ෂාව සීමිත වීම යි.
2. ජලයේ නියමිත ප්‍රමිතිය හා සිසිලනය ආරක්‍ෂා කිරීමට යි.
3. වැව් ජලය කෘෂිකාර්මික කටයුතු සඳහා පමණක් ප්‍රමාණවත් වීම යි.
4. වියලි කලාපීය ප්‍රදේශ වල ජල පරිහරණය අධික වීම යි.

18. වැව් බැම්මේ ස්ථායීතාව ආරක්‍ෂා කර ගැනීමට අපේ පැරණි වාරි ශිල්පීන් භාවිත කර ඇති තාක්‍ෂණයේ ස්වරූපය අවබෝධ කර ගැනීමට පුරා විද්‍යාඥයින් කැනීම් කොට පරීක්‍ෂා කරන ලද වැව කුමක් ද?

1. මහකනදරා වැව 2. කවුඩුල්ල වැව 3. සීගිරිය වැව 4. මින්නේරිය වැව

19. රුවන්වැලිසෑයේ අත්තිවාරම සකස් කිරීමේ දී යොදා නොගත් ද්‍රව්‍යයක් වන්නේ,

1. කිරිමැටි ය 2. රත්සිරියල් ගල් ය 3. වෙඬරු මැටි ය 4. දිවුල් මැලියම් ය

20. ක්‍රි. ව. 5 වන සියවසේ ඉදිකරන ලද විශිෂ්ට නාගරික මධ්‍යස්ථානයකට නිදසුනකි,

1. ගෝකණ්ණතිත්ථ 2. මාතොට 3. මිහින්තලය 4. සීගිරිය

21. ශ්‍රී ලංකාවේ පුරාණ යකඩ නිස්සාරණ තාක්‍ෂණය පිළිබඳ ක්‍රි. ව. 2400 ට දින නිර්ණය කරන ලද යබොර කැබැල්ලක් සොයාගෙන ඇත්තේ කුමන ප්‍රදේශයෙන් ද?

1. සමනල වැව 2. බෙරගල 3. අලකොළ වැව 4. අලිගල

22. අතීතයේ මෙරට ප්‍රධාන මංමාවත් වල ගව්වෙන් ගව්වට ගල්කණු සිටුවා තිබූ බවට සාක්ෂි හමුවී ඇති ප්‍රදේශයක් වන්නේ,

1. ගල්පාය ය 2. දැදිගම ය 3. කටුගල්ගේ ය 4. දඹුල්ල ය

23. මෙරට අතීත සෙල්ලිපි වල කුඩීන් ලෙස හඳුන්වා ඇත්තේ කවුරුන් ද?

1. සාමාන්‍ය ජනතාව 2. ධනවත් වෙළෙඳ ප්‍රධානීන්
3. රජයේ නිලධාරීන් 4. සාමාන්‍ය වෙළෙන්දන්

24. මෙරට බදු නීතිය යටතේ ඇළ මාර්ග වල මත්ස්‍යයින් ඇල්ලීම වෙනුවෙන් අය කළ බදු හැඳින්වූයේ කුමන නමකින් ද?

1. කැති අඩ 2. බොජකපති 3. දකපති 4. මතරමපිබක

25. අතීතයේ මෙරට විනිමය කටයුතු වලදී කාසි වෙනුවට ලෝහ බර වටිනාකමක් ලෙස භාවිතා වී ඇති බවට සාක්ෂි හමු වී ඇති ස්ථානයක් පහත පිළිතුරු අතරින් තෝරන්න.

1. ජේතවන විහාරය 2. අභයගිරිය 3. ආලාහන පිරිවෙන 4. ලෝවාමහාපාය

- **පහත සඳහන් වගුව උපයෝගී කොටගෙන 26, 27 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

| රජතුමා | සෙල්ලිපිය | සඳහන් කරුණු |
|---|---|---|
| A හතරවන මිහිඳු<br>D තුන්වන උදය<br>G පස්වන කාශ්‍යප | B බුද්ධන්නෙහෙල<br>E කොන්ඩවට්ටවාන්<br>H අනුරාධපුර පුවරු ලිපිය | C උස් ගොඩබිම් ඉඩම්වල කැලෑ නොකැපීම<br>F වනාන්තර වල ගස්කොළන් නොකැපිය යුතුබව<br>I ගස් කොළන් කළමණාකරණයේදී රජයේ නීති වලට අනුව කටයුතු කළ යුතු බව |

26. තුන්වන උදය රජතුමා විසින් පරිසරය ආරක්‍ෂා කර ගැනීම සඳහා පනවා ඇති නීති හා ඒ බව සඳහන් සෙල්ලිපිය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

1. BF 2. HF 3. BC 4. EG

27. උස් ගොඩබිම් ඉඩම්වල කැලෑ නොකැපිය යුතු යැයි සඳහන් කර ඇති රජතුමා සහ එම සෙල්ලිපිය දැක්වෙන පිළිතුර තෝරන්න.

1. DH 2. AB 3. AH 4. DE

28. ක්‍රි. ව. 1796 ඉංග්‍රීසීන් ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශ අල්ලා ගන්නා අවස්ථාවේදී උඩරට පාලකයා වූයේ කවුරුන් ද?

1. රාජාධිරාජසිංහ රජු 2. ශ්‍රී විජය රාජසිංහ රජු
3. සෙනරත් රජු 4. දෙවන විමලධර්මසූරිය රජු

29. මහනුවර රාජධානි සමයේ අදිකාරම්වරුන්ගේ ආඥා හෝ පණිවිඩ ගෙනගිය පිරිස හැඳින්වූයේ කුමන නමකින් ද?
1. පල්ලෙගම්පහ 2. ලියන රාල 3. උඩගම්පහ 4. කටුපුල්ලේ

A දෙවන පරාක්‍රමබාහු
B හතරවන පරාක්‍රමබාහු
C පළමුවන බුවනෙකබාහු
D සිව්වන බුවනෙකබාහු
E සවුළු විජයබාහු
F තෙවන වික්‍රමබාහු

ඉහත තොරතුරු උපයෝගී කොටගෙන 30, 31, 32 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

30. කුරුණෑගල රාජධානියේ රජකළ රජවරු දෙදෙනෙකු දැක්වෙන පිළිතුර තෝරන්න
1. BC 2. BE 3. DE 4. AD

31. ගම්පොළ රාජ්‍ය සමයේ මාතෘ මූලික ක්‍රමයට මාමාගෙන් බෑනාට රජකම හිමිවීමේ සම්ප්‍රදායට සම්බන්ධ රජවරු දෙදෙනා කවුරුන් ද?
1. AB 2. BD 3. DF 4. CD

32. දඹදෙනිය රාජ්‍ය සමයේ සාර්ථකව විදේශ ආක්‍රමණ වලට මුහුණ දී රාජ්‍ය ආරක්ෂා කරගත් රජවරු දෙදෙනා තෝරන්න.
1. AE 2. BF 3. CE 4. AC

33. මහනුවර රාජධානිය පාලනය කළ රජවරු රජවීමට පෙර භාවිත කළ නම් නිවැරදිව ගළපා පිළිතුර තෝරන්න.

| | |
|---|---|
| 1 කොනප්පු බණ්ඩාර | A ශ්‍රී වික්‍රම රාජසිංහ |
| 2 ටිකිරු කුමරු | B දෙවන රාජසිංහ |
| 3 මහා අස්ථාන කුමරු | C පළමුවන විමලධර්මසූරිය |
| 4 කන්නසාමි කුමරු | D පළමුවන රාජසිංහ |

1. ACBD 2. BDCA 3. CDBA 4. DABC

34. මහනුවර රාජධානි සමයේ රජවාසල ප්‍රයෝජනය සඳහා වෙන්කළ ඉඩම් හැඳින්වූයේ කුමන නමකින් ද?
1. නින්දගම් 2. පරවේනිගම් 3. විහාරගම් 4. ගබඩාගම්

35. යුරෝපයේ පුනරුදය ආරම්භ වූ රට හා නගරය පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
1. ඉතාලිය - රෝමය
2. ග්‍රීසිය - ඇතැන්ස්
3. ඉතාලිය - ප්ලෝරන්ස්
4. ප්‍රංශය - පැරිස්

36. දේශගවේෂණ කටයුතු සඳහා මුලින්ම උනන්දු වූ රටවල් දෙකක් වූයේ,
1. බ්‍රිතාන්‍ය හා ප්‍රංශය යි
2. පෘතුගාලය හා ඉතාලිය යි
3. ඕලන්දය හා පෘතුගාලය යි
4. පෘතුගාලය හා ස්පාඤ්ඤය යි

37. යුරෝපයේ වැඩවසම් යුගයේ ප්‍රාදේශීය පාලකයන් ලෙස කටයුතු කළේ කවුරුන් ද?
1. වංශාධිපතිවරු
2. පූජකවරු
3. මධ්‍යම පාන්තිකයින්
4. වෙළෙඳ පන්තිය

38. මෙරට පෘතුගීසීන්ට එරෙහි ප්‍රහාර වලදී මායාදුන්නේ රජුට ආධාර සැපයූ කැලිකට් පාලකයා කවුරුන් ද?
1. ලොරෙන්සෝ ද අල්මේදා
2. සැමොරින්
3. සල්මාන්
4. පිලිප් ද ඔලිවේරා

- පෙරෝලොපෙස් ද සූසා
- ජෙරනිමෝ ද අසවේඩු

39. ඉහත සඳහන් පෘතුගීසි නායකයින් මෙහෙය වූ උඩරටට එරෙහි සටන් ඇති වූ ස්ථාන පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
1. දන්තුරේ සහ රන්දෙනිවල
2. බලන සහ ගන්නොරුව
3. දන්තුරේ සහ බලන
4. රන්දෙනිවෙල සහ ගන්නොරුව

40. ශ්‍රී ලංකාවට පැමිණි පළමු ලන්දේසි ජාතිකයා කවුරුන් ද?
1. සිබෙල් ද වර්ට්
2. වෙස්ටර්වල්ඩ්
3. බැරන් වැන් එක්
4. ජොරිස් වැන් ස්පිල්බර්ජන්

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

Learning Resource Centre
De Mazenod College
Kandana
58142

වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
**Year End Evaluation - 2024 (2025)**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 3 යි |

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................

- සැලකිය යුතුයි.
- I කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට ද III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි

## I කොටස

01. අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) පොළොන්නරුව, මහනුවර, මාතොට, කදුරුගොඩ, ගෝකණ්ණතිත්ථ, කලා ඔය, සල්වතොට, කිරිඳි ඔය, මිනිහාගල්කන්ද, දේවනගර, සීගිරිය, හුරුළු වැව (ල. 12)

(ii) ඉතාලිය, පර්සියන් බොක්ක, කොන්ස්තන්තිනෝපලය, ගෝව, ජාවා දූපත, සියම් දේශය (තායිලන්තය) (ල. 06)

ආ)

(i) පහත A, B, C, D යටතේ දක්වා ඇති ප්‍රශ්න වලට පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - කෝට්ටේ රාජධානියේ අවසාන පාලකයා -
B - ශ්‍රී ලංකාව රතුකැට දිවයින ලෙස හැඳින් වූ අරාබි ජාතික ඉතිහාසඥයා -
C - පෘතුගීසින් ශ්‍රී ලංකාව හැඳින්වූ නම -
D - ගම්පොළ රාජ්‍ය අවසාන කාලයේ ශ්‍රී ලංකාව ආක්‍රමණය කළ චීන සෙන්පතියා - (ල. 04)

- A හා B යටතේ ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අනුපිළිවෙළින් ලියා දක්වන්න.

(ii) 1. 'A' වලින් දැක්වෙන නිර්මාණයේ නම කුමක් ද?
2. මෙය කිනම් ආගමකට අයත්ද?
3. මෙය පිහිටා ඇත්තේ ශ්‍රී ලංකාවේ කවර ඓතිහාසික නගරයක ද?
4. මෙය ගොඩ නගන ලද්දේ ශ්‍රී ලංකාව යටත්කර ගත් කවර විදේශීය ජාතියක් ද?


A

(ල. 04)

(iii) 1. 'B' වලින් දැක්වෙන ප්‍රතිමාවෙන් නිරූපිත රජතුමා කවුරුන් ද?
2. මෙම ප්‍රතිමාව දක්නට ලැබෙන ස්ථානය නම් කරන්න.
3. මෙතුමා සිය තානාපති නිලධාරීන් පිටත් කර හැරියේ කුමන රටකට ද?
4. එම දූත ගමනේ අරමුණ කුමක් ද?


B

(ල. 04)

## II කොටස

02. i) පහත සඳහන් ප්‍රාග් ඓතිහාසික වාසස්ථාන පිහිටි පරිසර කලාප A, B, C, අනුපිළිවෙළින් ලියන්න.

A - පාහියන්ගල

B - පොතාන

C - බුන්දල (ල.03)

ii) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ සාධක හතරක් සඳහන් කරන්න. (ල.04)

iii) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යුහය හා ස්වරූපය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල.05)

iv) පූර්ව ඓතිහාසික යුගයේ මානවයින් සතුව පැවති තාක්ෂණික දැනුම කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න. (ල.06)

03. i) පහත A, B, C, වලට අදාල තොරතුරු අනුපිළිවෙළින් ලියන්න

A - ගම්කයින් ගෘහපතීන් අතරින්ම පත් වූ බව සඳහන් මූලාශ්‍රය -

B - සුමන නම් ගෘහපතියකු පිළිබඳ සඳහන් සෙල්ලිපිය -

C - පරුමකවරුන්ට කිසියම් ආකාරයක ප්‍රාදේශීය පාලන බලයක් හිමි ව තිබූ බව පෙන්වා දීමට උපයෝගී කරගත හැකි සෙල්ලිපිය - (ල.03)

ii) පහත සඳහන් රාජත්ව සංකල්ප වලින් හැඳින්වූ රජවරු අනුපිළිවෙළින් ලියන්න.

A අලකපය මහරජ - B නරඉසෙර -

C චක්‍රවර්තී - D දේවත්ව - (ල.04)

iii) පැරණි ශ්‍රී ලංකාවේ රාජ්‍ය උරුමය හිමි වූ ආකාරය උදාහරණ සහිතව විස්තර කරන්න. (ල.05)

iv) දුටුගැමුණු රජතුමා මෙරට බිහි වූ ශ්‍රේෂ්ඨ පාලකයකු බව කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න. (ල.06)

04. i) රටක පාලනය මෙහෙයවන ආයතන තුන නම් කරන්න (ල.03)

ii) සොරබොර වැව ටැම් ලිපියේ වෙළෙඳපොලක පාලනය පිළිබඳ ඇතුළත් නීති දෙකක් දක්වන්න (ල.04)

iii) රටේ ජනතාවගේ පොදු සෞඛ්‍ය පහසුකම් නගා සිටුවීමට අපේ පැරණි පාලකයින් කටයුතු කළ ආකාරය නිදසුන් දෙකක් දක්වමින් පැහැදිලි කරන්න (ල.05)

iv) පුරාණ කාලයේ ශ්‍රී ලංකාවේ දියුණුව පැවති කර්මාන්ත පිළිබඳ කරුණු තුනක් යටතේ පැහැදිලි කරන්න (ල.06)

05. i) පහත සඳහන් වාරි නිර්මාණ කර වූ රජවරු අනුපිළිවෙළින් ලියන්න.

A - ඇළහැර ඇළ -

B - යෝධ ඇළ -

C - මිනිපේ ඇළ - (ල.03)

ii) පහත සඳහන් කාර්යයන් සිදු කෙරෙන වැවෙහි ප්‍රධාන අංග මොනවා දැයි ABCD අනුපිළිවෙළින් ලියන්න.

A - වැව් බැම්ම සේදී යාම වැළැක්වීම -

B - වැවේ අතිරික්ත ජලය පිටකිරීම -

C - වැවෙහි ජලය නිකුත් කිරීමේදී වැව් බැම්මට සිදුවන පීඩනය වැළැක්වීම -

D - වර්ෂා කාලයකින් පසුව වැවේ එක්රැස්වන රොන්මඩ ඉවත් කිරීම - (ල.04)

iii) ශ්‍රී ලංකාවේ පුරාණ යකඩ නිස්සාරණ තාක්ෂණය නිදසුන් දෙකක් දක්වමින් විස්තර කරන්න. (ල.05)

iv) මැනීම හා ගණනය පිළිබඳ අපේ පැරන්නන් සතු දැනුම උදාහරණ තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල.06)

06. i) පහත සඳහන් සාහිත්‍ය කෘති රචනා වූ රාජධානි යුග ABC අනුපිළිවෙළින් ලියන්න.

A - කව්සිළුමිණ -

B - තිසර සංදේශය -

C - ලෝවැඩ සඟරාව - (ල.03)

ii) පහත සඳහන් තොරතුරු හා සම්බන්ධ පාලකයින් ABCD අනුපිළිවෙළින් ලියන්න.

A - දඹදෙණිය රාජධානියේ ආරම්භක පාලකයා -

B - ඉන්දියාවට ගොස් කුලශේකර රජු හමු වී දළඳාව ලබා ගෙන පොළොන්නරුවේ රජ වූ පාලකයා -

C - ගම්පොල රාජ්‍ය සමයේ දැදිගම රාජධානියක් ගොඩනගා ගත් පාලකයා -

D - යාපහය රාජධානියේ ආරම්භක පාලකයා - (ල.04)

iii) පොළොන්නරුව රාජධානිය බිඳ වැටීමට බලපෑ හේතු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.05)

iv) කෝට්ටේ රජකළ හයවන පරාක්‍රමබාහු රජතුමා ශ්‍රේෂ්ඨ පාලකයෙකු බව නිදසුන් තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල.06)

07. i) පහත සඳහන් තොරතුරු හා සම්බන්ධ නිවැරදි පිළිතුරු ABC අනුපිළිවෙළින් ලියන්න.

A - උඩරට රාජධානියේ ආරම්භක පාලකයා

B - ක්‍රි. ව. 1580 උඩරට ආක්‍රමණය කළ සීතාවක පාලකයා

C - විජයබා කොල්ලය ඇති වූ සමයේ මායාදුන්නේ රජුට ආධාර සැපයූ උඩරට පාලකයා (ල.03)

ii) මහනුවර රාජධානිය පාලනය කළ නායක්කාර් වංශික රජවරු හතර දෙනෙක් සඳහන් කරන්න. (ල.04)

iii) මහනුවර රාජ්‍ය සමයේ කෘෂිකාර්මික කටයුතු සංවිධානය වී තිබූ ආකාරය කරුණු දෙකක් යටතේ පැහැදිලි කරන්න. (ල.05)

iv) මහනුවර රාජධානියේ පරිපාලන කටයුතු සංවිධානය වී තිබූ ආකාරය කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න. (ල.06)

## III කොටස

08. i) පුනරුද සමයේ කතෝලික සභාවේ ඇතැම් දුර්වලතා විවේචනය කළ තිදෙනෙක් සඳහන් කරන්න. (ල.03)

ii) පහත සඳහන් නිර්මාණ ලොවට දායාද කළ පුද්ගලයන් ABCD අනුපිළිවෙළින් ලියන්න.

A - ඩිවිනා කොමීඩියා කාව්‍ය ග්‍රන්ථය

B - ලෝරාට සැහැලි කවි නම් ග්‍රන්ථය

C - අන්තිම රාත්‍රී භෝජන චිත්‍රය

D - ආදම්ගේ චිත්‍රය (ල.04)

iii) පුනරුද සමයේ කලා ශිල්ප ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.05)

iv) පුනරුද සමයේ යුරෝපයේ දේශපාලන හා ආර්ථික ක්ෂේත්‍ර වල සිදු වූ වෙනස්කම් තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.06)

09. i) පුනරුද සමයේ බිහි වූ මූර්ති නිර්මාණ තුනක් සඳහන් කරන්න. (ල.03)

ii) පහත සඳහන් විද්‍යාත්මක නිර්මාණ ලොවට හඳුන්වාදුන් පුද්ගලයන් ABCD අනුපිළිවෙළින් ලියන්න.

A - මුද්‍රණ යන්ත්‍රය

B - ගුරුත්වාකර්ෂණ නියමය

C - රුධිර සංසරණ පද්ධතිය

D - දුරදක්නය නිපදවීම (ල.04)

iii) යුරෝපීය ජනතාවට නව මුහුදු මාර්ග සොයා යාමේ ගමන සාර්ථක කර ගැනීමට වඩාත් පහසු වූ සාධක දෙකක් නිදසුන් දෙමින් විස්තර කරන්න. (ල.05)

iv) පුනරුදයේ බලපෑමෙන් ශ්‍රී ලංකාවේ ආර්ථික ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්කම් තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.06)

Learning Resource Center
R
De Mazenod College
Kandana

# පොත් 3 ක් ගත්තොත්, 1 ක් නොමිලේ.






## 25%
දක්වා වට්ටම් හිමිකරගන්න.

**හොඳම පොත් අඩුම මිලට**
අපෙන් විතරමයි...

Atlas
Richard
RATHNA EXERCISE BOOKS

දැන්ම
lol.lk වෙත
පිවිසෙන්න

CASH ON DELIVERY | VISA | mastercard | KOKO

LOL.LK
LOL STORE (PVT) LTD

COD
CASH ON DELIVERY

037 20 60 110
071 77 74 440

